# සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් හෙළිවන පුරාතන ලංකාවේ නර්තන කලාව

එන්.පී.එස්.ඩබ්. කීර්තිරත්න[1], එම්.ඩී.ඩී. මධුෂානි[2]

පුද්ගලයා තුළ රිද්මයානුකූලව සිදු කෙරෙන දේහ චලනයන් 'නර්තනය' ලෙස හැඳින්විය හැකිය. මෙකී නර්තනය විටෙක කලාත්මක අංගයක් ලෙසත් තවත් විටෙක සමාජ සංස්කෘතික පදනම හැඩගැසීම උදෙසාත් භාවිතා වී තිබේ. සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය පදනම් කරගනිමින් පුරාතන ලංකාවේ නර්තන කලාව පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම මෙරට නර්තන කලාව සමාජගත සාධකයක්ව පැවති බව බිල්ලෑව සහ තන්තිරිමලය ගුහා ආශ්‍රිතව නර්තන විලාසය දක්වන මානව රූප හමුවීම මඟින් පැහැදිලි වේ. ප්‍රාග් ඓතිහාසික අවධියේ සිටම නර්තන කලාව පැවතිය ද, එහි සුවිශේෂී වර්ධනයක් ඇති වූයේ ක්‍රි.පූ. තුන් වැනි සියවසේ බුදුදහම ලංකාවට පැමිණීමත් සමඟිනි. සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ පුරාතන ලංකාවේ නර්තන කලාව පැවති බවට සාධක හමුවන අතර, මහාවංසයෙහි විජය ලක්දිවට පැමිණෙන අවධියේ සිරිසවත්ථුපුරයේ පැවති මංගල උත්සවයක් පිළිබඳවත්, සතියක් පුරා නැටුම්, ගැයුම්, වැයුම් එහි සිදුකළ බවත්, දෙවනපෑතිස් රජු විසින් ථූපාරාම දාගැබේ නිධන් කිරීම සඳහා ධාතූන් වහන්සේලා වැඩම වූයේ නැටුම්, ගැයුම්, වැයුම්වලින් අලංකාර කරන ලද පෙරහැරකින් බවත් සඳහන් වේ. පැරණි ශ්‍රී ලංකාවේ නර්තන කලාව පිළිබඳ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් ද තොරතුරු අනාවරණය වී ඇත. ඒ අතර ක්‍රි.ව. පළමු වැනි සියවසේ අවසාන අවධියේ පිහිටවනු ලැබූ කොරවක්ගල හා සැස්සේරුව ශිලාලේඛනවල මෙරට නර්තන කලාව පැවති බවට සාධක හමු වේ. අනුරාධපුර කුට්ටම් පොකුණ අඩිතාලමේ තිබී සොයාගන්නා ලද ක්‍රි.ව. 6-7 කාලයට අයත් ලෝකඩින් කළ ලක්ෂ්මී රූපය මඟින් ද, අනුරාධපුර අවධිය වන විට ලංකාවේ නර්තන කලාව සමාජගත සාධකයක්ව පැවති බවට සාධක සපයයි. අභයගිරියේ සොයාගන්නා ලද භාරතීය අංග ලක්ෂණ විදහාපාන ක්‍රි.ව. හය වැනි සියවසට අයත් කුළුණු කොටසක ස්ත්‍රීන් දෙදෙනෙකු නර්තනයේ යෙදෙන ආකාරය දැක්වෙන කැටයම් හමුවී තිබේ. ක්‍රි.ව. 12 වැනි සියවසට අයත් දැදිගමින් හමුවන ඇත්පහණ ආශ්‍රිතව දැකිය හැකි නර්තන හා වාද්‍ය රූප ඔස්සේ ද පුරාතන ලංකාවේ නර්තන කලාව පැවති බව පැහැදිලි වේ. ඒ අනුව ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම ක්‍රමයෙන් වර්ධනය වෙමින් ආ නර්තන කලාව වර්තමානය දක්වා සංස්කෘතිකාංගයක් ලෙස වර්ධනය වී ඇති බව පෙන්වාදිය හැකිය.

**ප්‍රමුඛ පද** : රිද්මයානුකූල, නර්තනය, වාද්‍ය රූප, සිරිසවත්ථුපුරය

[1 2] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. sachini98wathsala@gmail.com